**ශීර්ෂය 11 - මුදල් කොමිෂන් සභා කාර්යාලය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

ශීර්ෂය 11 - මුදල් කොමිෂන් සභා කාර්යාලයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සසැඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 සැප්තැම්බර් 19 දින කොමිෂන් සභාවේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම, සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

**2.1 විසර්ජන ගිණුම**

මුළු ප්‍රතිපාදනය වියදම

කොමිෂන් සභා කාර්යාලය සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 43.00 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 38.06 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව කොමිෂන් සභාව වෙත සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 4.94 ක් හෙවත් සියයට 11.49 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2015 දෙසැම්බර් 31දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 38.50 | 36.04 | 2.46 | 6.38 |
| මූලධන | 4.50 | 2.02 | 2.48 | 55.11 |
| එකතුව | 43.00 | 38.06 | 4.94 | 11.49 |

**2.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

කොමිෂන් සභා කාර්යාලයට අදාළ විෂය අංක 01101 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ .

| **වියදම** | | **ලැබීම්** | | **හර ශේෂය** | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 3.21 | 1.02 | 1.01 | 2.30 | 12.00 | 4.78 |

**2.3 පොදු තැන්පත් ගිණුම**

කොමිෂන් සභා කාර්යාලය යටතේ වන පොදු තැන්පත් ගිණුම් 2 ක 2015 දෙසැම්බර් 31 දිනට ශේෂවල එකතුව රු.50,050 ක් විය.

**2.4 විගණන නිරීක්ෂණය**

කොමිෂන් සභා කාර්යාලයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

**3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

**3.1 අධිකාරී බලය නොමැති වූ ගනුදෙනු**

2015 අගෝස්තු 03 දින සිට කොමිෂන් සභා කාර්යාලයේ සේවය කරන නිලධාරීන්ට තම මාසික ඒකාබද්ධ වැටුපෙන් ¼ ක දීමනාවක් ලබාදෙන අතර කොන්ත්‍රාත් පදනම මත සේවය කරන නිලධාරින් දෙදෙනෙකු වෙත එම දීමනාව ගෙවා තිබුණි.

**3.2 කාර්යසාධනය**

2015 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව කොමිෂන් සභාවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) පළාත් සභා 9 ක් වෙනුවෙන් කොමිෂන් සභාවෙ නිලධාරීන් විසින් සිදු කරන ලද 2014 වර්ෂයේ විගණන නිරීක්ෂණයන් සම්බන්ධයෙන් කොමිෂන් සභාවේ නිර්දේශ ඉදිරිපත් කිරීමේදී උතුර, දකුණ හා නැගෙනහිර පළාත් වෙනුවෙන් නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) පළාත්වල ප්‍රගති සමාලෝචන රැස්වීම් සඳහා සහභාගිවීමේදී සමාලෝචිත වර්ෂයේදී මධ්‍යම පළාත වෙනුවෙන් අනුයුක්ත කර තිබූ නිලධාරිණිය ඒ සඳහා සහභාගි වී නොතිබුණු අතර දකුණ, වයඹ, ඌව, සබරගමුව සහ නැගෙනහිර පළාත් සඳහා නිලධාරීන් අනුයුක්ත කර නොතිබුණි.

## 3.3 මානව සම්පත් කළමනාකරණය

------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) බඳවාගෙන තිබුණු අතිරික්ත සේවක සංඛ්‍යාව පිළිබඳව විධිමත් අනුමැතියක් ලබාගැනීමට කොමිෂන් සභා කාර්යාලය අපොහොසත් වී තිබුණි.

(ආ) කොමිෂන් සභාව විසින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද ස්ථිර තනතුරක් සඳහා කොන්ත්‍රාත් පදනම මත නිලධාරියෙකු බඳවාගෙන තිබුණි.